සමාජ සමීක්ෂා: සමාජීය විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය
ISSN 2478-0472
http://www.socialaffair.org

# ප්‍රජා වීඩියෝ කතා හා සමාජ සංවර්ධනය

චරිත් අමරසේකර*
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය

**සංක්ෂේපය**

වර්තමානය වන විට සංවර්ධනය (development) සඳහා ප්‍රජා සහභාගීත්වය (community participation) අනිවාර්යෙන්ම ලබා ගත යුතුය යන්න ව්‍යවහාරික සමාජ විද්‍යාඥයින්ගේ පිළිගනීමයි. ප්‍රජා සහභාගීත්වය නොමැතිව සංවර්ධනය පිළිබඳ සිතීමටවත් නොහැකි තරම්ය. මෙලෙස ප්‍රජා සහභාගීත්වය ඇතිව ප්‍රජාව උදෙසා නිර්මාණය වන කලාවක් ලෙස ප්‍රජා වීඩියෝ කතා හැඳින්වීමට පුළුවන. ප්‍රජාවක් තුළ ජීවත් වන්නාවූ පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමක අත්දැකීම් ප්‍රජාවේ සිටින අනිත් පුද්ගලයින් සමඟ බෙදා හදා ගැනීම ප්‍රජා වීඩියෝ ඔස්සේ සිදුවේ. එමඟින් පුද්ගලයින් අතර සන්නිවේදනය (communication) සහ සම්බන්ධතාවයන් (relationships) වැඩි දියුණු වේ. ඕනැම පුද්ගලයෙකුට ප්‍රජා වීඩියෝවක් නිර්මාණය කිරීමට හැකියාව පවතින අතර එම කුසලතාවයන් ද ලබා ගත හැක්කේ සමාජය තුළ ජීවත් වීම තුළිනි. එම නිසා ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය කිරීම සමාජ ඉගෙනුම් ක්‍රියාවලියක් (a social learning process) ලෙස හැඳින්වීම යුක්ති සහගතය. මෙය ප්‍රජාව විසින් ප්‍රජාව පිළිබඳව ම සාකච්ඡා කරන්නට භාවිත කළ හැකි මෙවලමකි. තව දුරටත් පැහැදිලි කරන්නේ නම් ප්‍රජා වීඩියෝ කතා තුළින් පුද්ගලයින්ට ලැබෙන ප්‍රතිලාභ රාශියකි. සැබැවින්ම මෙය සමාජය වෙනස් කිරීමටත් සමාජ සංවර්ධනය ඇති කිරීමටත් අත්වැලක් සපයනු ලබයි. මෙම ලිපිය මඟින් උත්සහ කරනුයේ ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය කිරීම පිළිබඳ මෙරට ජනයා දැනුවත් කිරීමයි. මූලික වශයෙන් ප්‍රජා වීඩියෝ කතා යනු කුමක්ද? යන්න පිළිබඳවත් ඒවා නිර්මාණය කර ගන්නා ආකාරය පිළිබඳවත් සවිස්තරයක් ඉදිරිපත් කරනු ලබයි. ඊට අමතරව ප්‍රජා වීඩියෝ කතා සමාජය වෙනස් කිරීමටත් සමාජ සංවර්ධනය ඇති කිරීමටත් භාවිත කළ හැකි ආකාරය පිළිබදවත් මෙම ලිපිය මඟින් සාකච්ඡා කෙරේ.

**මූලික පද:** ප්‍රජා වීඩියෝ කතා, ප්‍රජා සහභාගීත්වය, ප්‍රජා ගුවන් විදුලිය, ගැටුම් විපරිවර්ථනය, සහභාගීත්ව සන්නිවේදනය, සහභාගීත්ව මාධ්‍ය, සහභාගිත්ව ගැමි එළඹුම, ප්‍රජා සිතියම, ප්‍රජා බලසතුකරණය, කාන්තාවන් බලසතුකරණය

## හැඳින්වීම

වර්තමානය වන විට ලෝකය තුළ තොරතුරු තාක්‍ෂණය (information technology), සන්නිවේදනය (communication) හා මාධ්‍ය (media) යන ක්ෂේත්‍රයන් ඉතා ඉක්මණින් වෙනස්වීම්වලට භාජනය වේ. ඒ සඳහා නව දැනුම හා නුතන තාක්ක්‍ෂණය ඉවහල්

*කර්තෘ විද්‍යුත් ලිපිනය:
charithamarasekara@gmail.com

©2016 සමාජ සමීක්ෂා. This work is licensed under a Creative Commons Attribution-Non Commercial 4.0 International License.

වී ඇත. පුවත් සොයාගැනීම, වාර්තාකරණය හා සජීවී රූපරාමු පෙන්වීම ඉතා ඉක්මනින් හා සිත්ගන්නා සුළු ආකාරයෙන් මාධ්‍ය තුළ ඉදිරිපත් කරයි. නමුත් එම ප්‍රධාන ධාරාවේ මාධ්‍ය තුළින් සෑම ප්‍රජාවකටම පවතින ගැටලු ප්‍රකාශ කිරීමට ඉඩක් ලැබෙනවා ද? යන්න පිළිබඳ ඇත්තේ ගැටලුවකි. මන්ද අද වන විට මාධ්‍ය නාලිකා ක්‍රියාත්මක වන්නේ ලාබය, දේශපාලන න්‍යාය පත්‍ර, වෙළඳ දැන්වීම් ප්‍රචාරණය හා ප්‍රසිද්ධිය පදනම් කරගෙනය. එවැනි තත්ත්වයක් තුළ දුෂ්කර ප්‍රදේශවල ග්‍රාමීය ජනතාවගේ ප්‍රශ්න සඳහා ලැබෙන්නේ ඉතාම අඩු අවධානයකි. එබැවින් ප්‍රජාවගේ ප්‍රශ්න පිළිබඳව ප්‍රජාව විසින්ම නිර්මාණය කරන කතාව, කතාන්දරය ප්‍රජා වීඩියෝ කතා (community video storytelling) ලෙස සරලව හැඳින්විය හැක. "community video is a communication approach that engages local people in creating videos that represent their lives and concerns."(Communication for change, 2009, p.18). ප්‍රධාන ධාරාවේ මාධ්‍ය තම ගමට, ප්‍රදේශයට පැමිණෙන තුරු බලා නොසිට තමන්ගේ ගැටලුව පිළිබඳ බලධාරීන් දැනුවත් කිරීම සඳහා ප්‍රජාවට එක්වී ගොඩනැගිය හැකි මාධ්‍ය ආයතනයක් ලෙස ප්‍රජා වීඩියෝ කතා හැඳින්විය හැක. තම ගැටලුවට රජය පැමිණ විසඳුම් ලබා දෙන තුරු බලා නොසිට ප්‍රජා සහභාගීත්වය (community participation) මගින් විසඳුම් සොයා ගැනීමට ජනතාව පෙළඹවීමට ද මේ නිසා හැකි වේ. සමාජයෙන් අගතියට පත්වූ පුද්ගලයින්, දුප්පතුන්, අසරණයන්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්, ආබාධිතයන්, යාචකයින්, කාන්තාවන්, ළමයින්, රෝගීන් පිළිබඳ කතා නිර්මාණය කොට ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ද මෙම මාධ්‍ය භාවිත කළ හැකිය.

වර්තමානය වන විට ප්‍රජා වීඩියෝ සමාජය වෙනස් කිරීම සහ සමාජ සංවර්ධනය සඳහා යොදා ගනී. "Community-led video has been shown to be highly effective as both a means of conveying information and catalyzing social change and individual behavior change for improved agriculture, livelihoods, and health behaviors" (USAID, 2015, p1). මෙරට ක්‍රියාත්මක වූ මහවැලි ප්‍රජා ගුවන් විදුලිය (Mahaweli Community Radio) යටතේ ද ගොවීන්ගේ හා ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමටත් ඔවුන්ගේ ආකල්ප වෙනස් කිරීමටත් තමන්ගේ ආදායම් වැඩිකර ගැනීමටත් කාන්තාවන් බලගැන්වීම සඳහාත් කටයුතු කරන ලදී. ඊට අමතරව ජනතාව මුහුණපාන ගැටලු හඳුනා ගැනීමටත් ඒවා විසඳා ගැනීම සඳහා ජනතාව පෙළඹවීමටත් ඒ තුළින් ධනාත්මක විසඳුම් ලබා ගැනීමටත් මෙම වැඩසටහන් උපයෝගී විය. ජල කළමනාකරණය, මත්ස්‍ය වගාව, කෘමිනාශක භාවිතය, අස්වැන්න අලෙවි කිරීම පිළිබඳ ප්‍රජාව සමඟ දිගින් දිගටම සංවාදයක් ගොඩනඟා ගැනීමට මහවැලි ප්‍රජා ගුවන් විදුලි සේවාව උත්සහ කරන ලදී.

ප්‍රජා වීඩියෝ මගින් බොහෝදුරට සිදු කරන්නේ ජනතාවගේ දැනුම අලුත් කිරීම සහ ආකල්ප හා හැසිරීම් රටා වෙනස් කිරීමයි. ඇත්ත වශයෙන්ම ප්‍රජා වීඩියෝ කතා ප්‍රජාවේ සිටින පුද්ගලයින්ගේ සංවාදය, වගකීම හා දැනුවත් කිරීම පදනම් කරගෙන ගොඩනැගේ. ඒ සඳහා කැමරාව ප්‍රජාවගේ දෑතට පත් කළ යුතුවේ. ඉන්පසු ඔවුන්ට අවශ්‍ය කතාව, කතාන්දරය ඔවුන් විසින්ම නිර්මාණය කර ගනී. ගැටලු හඳුනා ගැනීම, ප්‍රමුඛතාවය අනුව ඒවා ලැයිස්තුගත කිරීම, ගැටලුවලට විසඳුම් සෙවීම ආදිය ද ඔවුන් විසින්ම සිදු කරයි. මෙවැනි වූ මෙවලමක් ලංකා සමාජය තුළ ප්‍රචලිත කිරීමෙන් සමාජයට අත්වන ප්‍රතිලාභ රාශියකි. මෙයින් ජනතාවගේ සාමූහිකත්වය දියුණු කළ හැකි අතර ඔවුන්ව බලගැන්විය හැක. "Participatory video as a tool for empowerment and resistance in third world communities"(Moodley, 2008, p1). අවස්ථාව අහිමි කර ඇති ජනතාව වෙනුවෙන් අවස්ථාව ලබාදීම සඳහා ද මෙම මාධ්‍ය භාවිතා කළ හැක. ලෝකය තුළ ගැටුම් විපරිවර්තනය (Conflict Transformation), සාමය ගොඩ නැගීම (Peace Building), ප්‍රචණ්ඩත්වය නැති කිරීම, සත්ව හා පරිසර සංරක්ෂණය ඇති කිරීම, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පවත්වාගෙන යාම සඳහා ප්‍රජා වීඩියෝ බහුලව භාවිත කරන බව පෙනී ගිය නමුත් ලංකා සමාජය තුළ වෙසෙන ජනතාවට ප්‍රජා වීඩියෝ කතා පිළිබඳ තවමත් ඇත්තේ අල්ප දැනුමකි. මෙරට ජනතාවට මෙය ආධුනික මාධ්‍යක් වන අතර එම ආධුනිකභාවය තුරන් කර දැමීම අපගේ යුතුකමකි. තමන්ගේ

ජංගම දුරකථනය භාවිතයෙන්ද ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය කළ හැක. එබැවින් මෙම මාධ්‍ය ක්‍රමය මෙරට සමාජයට හඳුන්වා දීම ඉක්මණින්ම සිදු කළ යුතුය. මන්ද එහි ප්‍රතිලාභ හිමිවන්නේ මෙරට සමාජය තුළ ජීවත් වන සාමාජිකයින් වීම නිසාවෙනි. ප්‍රජා වීඩියෝ කතා පිළිබඳ සාකච්ඡාව ආරම්භ කිරීම තුළින් ද බලාපොරොත්තු වන්නේ මෙම මෙවලම පිළිබඳ සමාජය දැනුවත් කරමින් ලංකා සමාජය තුළ එය ප්‍රචලිත කිරීමයි.

## ප්‍රජා වීඩියෝ කතා යනු කුමක්ද?

නූතනය වන විට ශ්‍රී ලංකා සමාජයට ආධුනික කලාවක් ලෙස ප්‍රජා වීඩියෝ කතා හැඳින්වීම යුක්ති සහගතය. මහවැලි ව්‍යාපාරය යටතේ ප්‍රජා ගුවන් විදුලි (Mahaweli Community Radio) සේවයක් මෙරට තිබුණද අද වනවිට එලෙස ප්‍රජා සහභාගීත්වය පදනම් කරගෙන සිදුකරන මාධ්‍යයක් දැකිය නොහැකි තරම්ය. ප්‍රජා වීඩියෝ කතා කලාව සන්නිවේදනය හා මාධ්‍ය යන ක්ෂේත්‍රයට අයත් වේ. ඇතම් මාධ්‍යවේදීන්ගේ අදහස වන්නේ මෙය නව මාධ්‍ය කලාව තුළින් බිහිවූවක් බවයි. නමුත් තව වසර දහයක්, විස්සක් ගතවන විට මෙම මාධ්‍ය කලාව මෙරට සමාජය තුළ ව්‍යාප්ත වෙනවාට සැක නැත. මන්ද මේවා ප්‍රජාව විසින් ප්‍රජාවේ යහපැවැත්ම උදෙසා සිදුකරන නිර්මාණයක් වීම නිසාවෙනි. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය ප්‍රජාව පිළිබඳ සැබෑ සැලකිල්ලක් දැක්වීමට අපොහොසත් වීම නිසා විකල්ප මාධ්‍යයක් (alternative media) ලෙසත් විකල්ප යාන්ත්‍රණයක් (alternative machanism) ලෙසත් ප්‍රජා වීඩියෝ කතා බිහි වී ඇත. ප්‍රජා වීඩියෝ හැඳින්වීම සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් 'Participatory Video' යන ව්‍යවහාරය ද භාවිත කරයි. ඒ සඳහා සිංහල අරුත ලෙස ' ප්‍රජා සහභාගීත්වය පදනම් වු වීඩියෝ' යන්න අපට යොදා ගැනීමට හැකිය. "Participatory video (also known as community video) has been used increasingly in community development practice, particularly, but not exclusively, in developing countries over the last 25 years˜ (Kindon, 2002, p.143). ප්‍රජාවේ ජීවත්වන මිනිසුන් විසින් ඔවුන්ගේ ජීවන අත්දැකීම් හා ඔවුන් මුහුණපාන ගැටලු පිළිබඳව නිර්මාණය කරන ලද සන්නිවේදන එළඹුමක් ලෙස (communication approach) ප්‍රජා වීඩියෝ හැඳින්විය හැක. මෙය යම් සමාජයක් නියෝජනය කරන පුද්ගලයින් හා කණ්ඩායම්වල විවිධත්වයන් මෙන්ම ගැටලු සහ වැඩදායි පුද්ගලයින්ගේ ආදර්ශයන හා ආදර්ශමත් චරිත කතා පෙන්වමින් ප්‍රජාව වෙනුවෙන් නිෂ්පාදනය කරන කෙටි වීඩියෝ කතාවකි. මෙලෙස නිර්මාණය කරන කෙටි කතාන්දර, වාර්තා ප්‍රජා වීඩියෝ කතා නම් වේ. ග්‍රාමීය ජනතාවගේ හඬ නියෝජනය කිරීම උදෙසා ප්‍රජා වීඩියෝ කතා මෙරටට හඳුන්වාදීමේදී ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය (Sri Lanka Development Jonnalist Forum) ප්‍රධාන නියමුවා බවට පත් වී ඇත. එම සංසදය විසින් තරුණ ප්‍රජා වීඩියෝ කතාකරුවන් ඇගයීමට ලක් කරමින් 2016 වර්ෂයේදී වීඩියෝ සම්මේලනයක් (national youth video Summit) මෙරට පවත්වන ලදී. ප්‍රජා වීඩියෝ කතා යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? යන්නට පිළිතුරු සෙවීමේදී ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය සංවිධානය කරන ලද ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය පිළිබඳ වැඩමුළුවේ දී එයට සහභාගීවූවන්ගේ හා සම්පත්දායකයින්ගේ අදහස් ඉතා වැදගත් වේ.

''මාධ්‍ය කියන මෙවලම තමන් අතට අරන් තමන්ගේම ප්‍රශ්නයක් මුලික කරගෙන තමන්ම කතාවක් නිර්මාණය කරමින් තමන්ගේම ජනතාවටම නැවත ලබා දීම ප්‍රජා වීඩියෝ කතා ලෙස හඳුන්වන්න පුළුවන් ''

එම්.සී. රශ්මින්
අධ්‍යක්ෂක - ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය.

''ප්‍රජා වීඩියෝ යනු තම ප්‍රජාවේ කතා නිර්මාණය කිරීම සඳහා ප්‍රජාව බලගැන්වීමයි. මෙහිදී ප්‍රජාවේ සිටින පුද්ගලයින්ට තමන්ට අවශය කරන කතාව නිර්මාණය කිරීම සඳහා කැමරාව ඔවුන්ගේ අතට පත් කරයි. ප්‍රජා වීඩියෝ මගින් ප්‍රජාවේ පවතින ආදර්ශයන් හා ආදර්ශමත් චරිත පිළිබඳ කතාන්දර සාකච්ඡා කළ හැක''

ආචාර්ය වාසුකි බෙලවාඩි
හයිද්‍රාබාද් විශ්ව විද්‍යාලය, ඉන්දියාව.

''ප්‍රජා වීඩියෝ නැතිනම් ප්‍රජාසහභාගීත්ව වීඩියෝ යන්න සමාජයේ සිටින සාමාන්‍ය

මිනිසුන්ගේ, දුප්පත් මිනිසුන්ගේ, සමාජයෙන් අගතියට පත්වුවන්ගේ ප්‍රශ්න හඳුනා ගැනීම සඳහා වැදගත් වන මාධ්‍යයක් ලෙස හැඳින්විය හැක. ශ්‍රී ලංකා සමාජය ගත් විට එහි දැවෙන ප්‍රශ්න රාශියක් අපට දැක ගත හැක. වර්තමානය වන විට මත්ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නය, කුණු කසල පිළිබඳ ප්‍රශ්නය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳව ප්‍රශ්නය ආදී වූ ප්‍රාථමික ප්‍රශ්න හා එහි අතුරු ප්‍රතිඵල ලෙස මතු වී තිබෙන ද්විතීයික හා තෘතීයික ප්‍රශ්න රාශියක් ඇමතීම සඳහා මෙය භාවිත කළ හැකිය''

නිරාජ් පීරිස්
ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය පිළිබඳ
වැඩමුළුව සඳහා සහභාගී වූවෙක්.

''විද්‍යුත් මාධ්‍යයකින් හෝ මුද්‍රිත මාධ්‍යයකින් අපේ ප්‍රශ්න ප්‍රකාශ කරන තුරු බලා නොසිට අපේ ප්‍රශ්න අපිම හඳුනාගැනීමටත් එම ප්‍රශ්නවලට විසඳුම් අපි විසින්ම සොයා ගැනීමටත් ප්‍රජා වීඩියෝ උපකාරී වේ. මෙය ප්‍රජාව තුළින් ගොඩනැගී ප්‍රජාව සඳහාම නිර්මාණය වූ මාධ්‍යයකි.''

ෆාතිමා ෂනාස්.
ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය පිළිබඳ
වැඩමුළුව සඳහා සහභාගී වූවෙක්.

ප්‍රජා වීඩියෝ කතා තුළ සිදුවන සාකච්ඡාව සහභාගීත්ව සන්නිවේදනය (paticipatory communication) පදනම් කරගෙන ක්‍රියාත්මක වේ. සහභාගීත්ව සන්නිවේදනය තුළ දැකිය හැකි එළඹුම් කිහිපයකි. සහභාගීත්ව නාට්‍යය (participatory drama), ජන හා සාම්ප්‍රදායික රංගනයන් (folk and traditional performance forms), සහභාගීත්ව පිංතූර කලාව (particicipatory photography), සහභාගීත්ව අන්තර්පුද්ගල සන්නිවේදනය (participatory interpersonal communication) සහ සහභාගීත්ව මාධ්‍ය (participatory media) ආදිය එම එළඹුම් ලෙස දැක්විය හැක. ප්‍රජා ගුවන් විදුලිය හා ප්‍රජා වීඩියෝ කතා සහභාගීත්ව මාධ්‍යය එළඹුමට අයත් වන මෙවලම් දෙකකි. මෙහි දී අරමුණු, අවශ්‍යතාවයන් හා අපේක්ෂිත වෙනස්කම් පිළිබඳ ප්‍රමුඛතාවයක් දක්වනු ලබයි. මෙහි දී තිරස් සන්නිවේදනය (horizontal communication) මගින් ප්‍රජාවේ සිටින සෑම සාමාජිකයෙකුටම තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දෙනු ලැබේ. එක් එක් පුද්ගලයා විසින් සිදුකරන ක්‍රියාකාරකම් තුළින් වීඩියෝ කතාව නිර්මාණය කිරීමේ දී සාමූහික පැවැත්ම ගොඩනැගේ. මෙය හුදෙක්ම වීඩියෝවක් නිර්මාණය කිරීම නොව සාමූහික වශයෙන් සිදුකරන ක්‍රියාකාරකමකි. මෙමඟින් ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා ද ප්‍රජාවට අවස්ථාව ලැබේ. බාහිර පාර්ශවයකින් විසඳුම් ලැබෙන තුරු බලා නොසිට ගැටලුවලට සුදුසුම විසඳුම් ලබා ගැනීමට ප්‍රජාවට මෙයින් හැකි වේ. ඊට අමතරව මෙමඟින් ප්‍රජාවට තමන්ගේ ප්‍රශ්න එළිදරවු කිරීමට, සාමූහිකව තීරණ ගැනීමට හා විසඳුම් ලබා ගැනීමට හැකි වන නිසා ප්‍රජාව බලගැන්වීමට (empowerment) ලක් වෙයි. ප්‍රජා වීඩියෝ කලාව ලෝකය තුළ බහුලව භාවිතා කරන්නේ ගැටුම් විපරිවර්තනය කිරීම, සාමය ගොඩනැගීම, ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය නැති කිරීම, පශ්චාත් - මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පාලනය කිරීම සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ය. ඊට අමතරව ස්ත්‍රී පුරුෂ සමාජ භාවය නැති කිරීම, සහජීවනය හා ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම සඳහා වන කතිකාවකට ද මේවා උපකාරී කොට ගෙන ඇත.

*මහවැලි ප්‍රජා ගුවන් විදුලිය*

*දකුණු ආසියාවේ ප්‍රථම ගුවන් විදුලි සේවාව ආරම්භ කිරීමේ ගෞරවය හිමිවන්නේ ශ්‍රී ලංකාවටයි. ඒ සඳහා 1981 දී ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව (SriLanka Broadcasting Corporation) විසින් යුනෙස්කෝ සංවිධානයේ (UNESCO) සහ ඩෙනිෂ් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සියේ (Danish International Development Agency) සහයෝගය ඇතිව මෙරට තුළ මහවැලි ප්‍රජා ගුවන් විදුලිය (Mahaweli Community Radio) ආරම්භ කරන ලදී. මහවැලි ව්‍යාපාරය යටතේ පදිංචි කරන ලද ජනතාවගේ සමාජ - ආර්ථික හා සමාජ - සංස්කෘතික යන ක්ෂේත්‍ර සංවර්ධනය කිරීම පදනම් කරගෙන මෙම ගුවන් විදුලි සේවාව ආරම්භ කරන ලදී. මෙහි ප්‍රධාන කාර්යාලය මහනුවර පේරාදෙණිය ප්‍රදේශයේ පිහිටුවන ලදී. ප්‍රධාන වශයෙන් මෙමඟින් කෘෂිකාර්මික කටයුතු හා ග්‍රාමීය ජීවිතය නඟා සිටුවීම සඳහා ප්‍රජාවට සහයෝගය ලබා දෙන ලදී. ප්‍රජා*

*සහභාගීත්වය ලබාගනිමින් ඔවුන්ගේ දෛනික ජීවිතය හා බැඳුණු ක්‍රියාව, සෞඛ්‍ය, ගොවිතැන, ආදායම පිළිබඳ වැඩසටහන් ප්‍රජා ගුවන් විදුලිය හරහා විකාශනය කරමින් ග්‍රාමීය ජනතාව අභිප්‍රේරණය කරන ලදී. මෙම ගුවන් විදුලිය සඳහා සේවය කළ කාර්ය මණ්ඩලය පුහුණුවීම්, වැඩමුළු හා සම්මන්ත්‍රණවලට සහභාගී කරවමින් ප්‍රජාව සමඟ සන්නිවේදනය කළයුතු ආකාරය පිළිබඳවත්, ප්‍රජා සහභාගීත්වයේ වැදගත්කම පිළිබඳවත්, තාක්ෂණික මෙවලම් භාවිතා කරන ආකාරය පිළිබඳවත් දැනුම හා කුසලතා ලබා දෙන ලදී. ඒ සඳහා යුනෙස්කෝ සංවිධානය හා ඩෙනිෂ් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය මෙරටට සහයෝගය ලබා දී ඇත. ගොවීන්ගේ හා ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමටත් ඔවුන්ගේ ආකල්ප වෙනස් කිරීමටත් තමන්ගේ ආදායම් වැඩිකර ගැනීමටත් කාන්තාවන් බලගැන්වීමටත් මෙම ගුවන් විදුලි සේවාව කටයුතු කරන ලදී. ඊට අමතරව ජනතාව මුහුණපාන ගැටලු හඳුනා ගැනීමටත් ඒවා විසඳා ගැනීම සඳහා ජනතාව පෙළඹවීමටත් ඒ තුළින් ධනාත්මක විසඳුම් ලබා ගැනීමටත් මෙම වැඩසටහන් උපයෝගී විය. ජල කළමනාකරණය, මත්ස්‍ය වගාව, කෘමිනාශක භාවිතය, අස්වැන්න අලෙවි කිරීම යනාදිය පිළිබඳ ප්‍රජාව සමඟ දිගින් දිගටම සංවාදයක් ගොඩනගා ගැනීමට ප්‍රජා ගුවන් විදුලි සේවාව උත්සහ කරන ලදී. මීට අමතරව මහවැලි ව්‍යාපාරය යටතේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පවත්වාගෙන යාම පිළිබඳවත් ගායනය හා නාට්‍යය රඟ දැක්වීම ආදී සංස්කෘතික අංගයන් ඉදිරිපත් කිරීම සඳහාත් අවස්ථාව මෙම ගුවන්විදුලි සේවාවෙන් ලබාදෙන ලදී. අද වන විට මහවැලි ප්‍රජා ගුවන් විදුලි සේවාව හෝ වෙනත් ප්‍රජා විදුලි සේවාවක් මෙරට දක්නට නොලැබේ. දකුණු ආසියාවටම ප්‍රජා ගුවන් විදුලිය පිළිබඳ ආකෘතියක් ගොඩනැගූ මහවැලි ගුවන් විදුලි සේවාව දීර්ඝ කාලීනව ක්‍රියාත්මක නොවීම කණගාටුවට කරුණකි.*

## ප්‍රජා වීඩියෝ මාදිලි

ප්‍රජා වීඩියෝවල ප්‍රධාන ආකෘති 03ක් දක්නට ලැබේ. නාට්‍ය (drama) වාර්තා (documentary) සහ වාර්තා - නාට්‍ය (documentary – drama) ඒවා වේ. නාට්‍ය තුළ දී කිසියම් මාතෘකාවකට අදාළව කතාන්දරයක් නිර්මාණය කරනු ලැබේ. ගමක වකුගඩු රෝගයෙන් පෙළෙන පියෙකු මුහුණදෙන ගැටලු පිළිබඳ නාට්‍යාකාරයෙන් කතාවක් නිර්මාණය කළ හැක. එයින් ප්‍රජාවට සෘජුවම පණිවිඩය දැන්විය හැකි අතර මේ පිළිබඳව ප්‍රජාව සංවේදී කළ හැකිය. වාර්තාවක් ගත්විට යම්කිසි මාතෘකාවක් පිළිබඳ විස්තරාත්මකව තොරතුරු ඉදිරිපත් කරණු ලබයි. දෑස් නොපෙනෙන පුද්ගලයන් තම අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන යාමේ දී මුහුණදෙන අසීරුතා පිළිබඳ අපට වාර්තාමය වැඩසටහනක් සැකසිය හැක. එමඟින් ඔවුන් කෙරෙහි සමාජ අවධානය යොමු කරගත හැකිය. වාර්තා - නාට්‍ය අපට බහුලව දැකිය හැක්කේ එච්.අයි.වී/ඒඩ්ස්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, කෘෂිකාර්මික කටයුතු, මානව හිමිකම් ආදී මාතෘකාවන් සාකච්ඡා කිරීමේ දී ය. නාට්‍ය තුළින් අදාළ කතාපුවත සඳහා ප්‍රජාව සංවේදී කරන අතර කතාපුවතට අදාළ දත්ත, තොරතුරු, ඉතිහාසය හා වර්තමාන තත්ත්වය පෙන්වීම සඳහා විස්තරාත්මකව වාර්තාවක් ඉදිරිපත් කරයි.

## ප්‍රජා වීඩියෝ කතාවක් නිර්මාණය කිරීමේ පියවර

ප්‍රජා වීඩියෝ කතාවක් නිර්මාණය කිරීමේ දී එහි සම්පූර්ණ අයිතිය ප්‍රජාවට භාර දිය යුතුය. මෙම මාධ්‍යයේ වැදගත්කම පෙන්වා දීම, ප්‍රජාවේ ප්‍රශ්න හඳුනා ගැනීම හා ප්‍රමුඛතාවය අනුව ඒවා අනුපිළිවෙළට සකසා ගැනීම, කැමරාව, පරිගණකය හා මෘදුකාංග භාවිතා කිරීම සඳහා තාක්ෂණික දැනුම හා හැකියාවන් ලබා දීම ආදිය සඳහා ඔවුන්ට උදව් කළ යුතුය. ප්‍රජා වීඩියෝවක් සැකසීම සඳහා ප්‍රජාවක් විසින් සැලකිල්ලට ගතයුතු පියවරයන් කිහිපයක් හඳුන්වා දීම වැදගත් වේ.

- සහභාගීත්ව සන්නිවේදන සංකල්පය හඳුන්වා දීම. දේශීය යාන්ත්‍රණය තුළ මෙම මාධ්‍යයේ වටිනාකම පෙන්වා දීම.
- ප්‍රජාවේ අවශ්‍යතාවය/ප්‍රජා මූල සංවිධානයේ අරමුණු අනුව මාතෘකාවක් තේමාවක් තෝරා ගැනීම.
- ප්‍රජාවේ සිටින පුද්ගලයින්ට කැමරාව, පරිගණකය, රඟ දැක්වීම හා වාර්තාකරණය

පිළිබඳව පුහුණුව ලබා දීම.

- පොදු එකඟත්වය මත කතාව සඳහා මාතෘකාවක් තෝරා ගැනීම.
- වීඩියෝ කතාව කුමන ස්වරූපයකින් (නාට්‍ය, වාර්තා, වාර්තා - නාට්‍ය) ඉදිරිපත් කරන්නේ ද? යන්න තීරණය කිරීම.
- මෙම වීඩියෝව කවුරුන් වෙනුවෙන් ඉදිරිපත් කරන්නේ ද? යන්න හා ඉලක්ක ප්‍රේක්ෂක කණ්ඩායම යන්න හඳුනා ගැනීම.
- සහභාගීවන්නන්, රඟපාන පුද්ගලයන්, වැඩසටහන් ඉදිරිපත් කරන්නන්, දේශකයින් තෝරා ගැනීම.
- වීඩියෝව රූපගත කිරීම සඳහා ස්ථානයක් තෝරා ගැනීම.

කටු චිත්‍ර සටහන (storyboard) සැලසුම් කිරීම හා කැමරා රූප, දර්ශන හඳුනා ගැනීම.

සම්මුඛ සාකච්ඡා (interviews) සඳහා ප්‍රශ්න සැකසීම සහ කැමරා දර්ශන සඳහා පිටපත ලිවීම.

- රඟපාන පුද්ගලයින්, සම්මුඛ සාකච්ඡාව මෙහෙයවන්නන් හා සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නන් සමඟ පෙර පුහුණුවීම් සිදු කිරීම.
- ප්‍රජා සහභාගීත්වය ඇතිව කැමරා රූප හා දර්ශන වීඩියෝ ගත කිරීම.
- මෘදුකාංග භාවිතා කරමින් වීඩියෝව සකස් කිරීම.
- ප්‍රජාව සඳහා වීඩියෝව කිහිප වාරයක් විකාශනය කිරීම.
- ප්‍රජාවේ අදහස් පිළිබඳ අවධානය යොමු කිරීම.
- සංස්කරණය කිරීම හා අවසන් කිරීම.

## ප්‍රජාව වීඩියෝ භාවිතයට ගන්නා අවස්ථා.

ප්‍රජා වීඩියෝ නිර්මාණය කිරීම සඳහා ප්‍රජාවකට අවශ්‍යතාවයක් හා පෙළඹවීමක් ඇති විය යුතුය. එලෙස ම මේවා බහුලව භාවිතා කරන අවස්ථාවන් කිහිපයක් අපට හඳුනාගත හැකිය.

1. ප්‍රායෝගික පුහුණුවීම් ලබා දීම.

පුද්ගලයෙකුට යම්කිසි ක්‍රියාකාරකමක් පිළිබඳ ප්‍රායෝගිකව අවබෝධයක් ලබා ගැනීම සඳහා වීඩියෝ කතා උපකාරී වේ. උදාහරණයක් වශයෙන් දුම්පානය කරන්නෙකුට වැළඳෙන රෝග පිළිබඳ විග්‍රහයක් වීඩියෝව හරහා ප්‍රජාවට සෘජුව දැන්විය හැක.

2. අත්දැකීම් බෙදා - හදා ගැනීමට හැකිවීම.

යම්කිසි පුද්ගලයෙකුට, ප්‍රජාවකට, රටකට, කලාපයකට පවතින අත්දැකීම් ඊට පරිබාහිරව ඇති ක්ෂෙත්‍රයන්ට ලබා දීමට මේ හරහා සිදු කළ හැක. ශ්‍රී ලංකාවේ රජරට ප්‍රදේශයේ පවතින වකුගඩු රෝගයේ බරපතල තත්ත්වය රටේ අනෙක් ප්‍රදේශවලට ප්‍රජා වීඩියෝව හරහා ලබා දිය හැක. යම්කිසි ප්‍රජාවකට ආවේණික වූ අත්දැකීම් වෙනත් ප්‍රජාවක් සමඟ බෙදා ගැනීමට මේවා උපකාරී වේ.

3. ප්‍රතිපත්ති සම්පාදකයින්ට හා සැළසුම් සකස්කරන්නන්ට ප්‍රාදේශීය අවශ්‍යතා පිළිබඳව නිවැරදි චිත්‍රයක් පෙන්වීමට හැකි වීම.

ග්‍රාමීය ජනතාව විසින් පවත්වාගෙන යන මැටි කර්මාන්තය, කොහු කර්මාන්තය, හඳුන්කූරු කර්මාන්තය ආදී වූ ස්වයං රැකියා පිළිබඳ බලධාරීන් විසින් අඩු අවධානයක් යොමු කොට ඇත. එබැවින් එම කර්මාන්තය නැවත නඟා සිටුවීම සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම හා දැනුවත් කිරීම ප්‍රජා වීඩියෝව හරහා ලබාදිය හැක. ඊට අමතරව ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශවල මහාමාර්ග ඉතා අබලන් තත්ත්වයෙන් ඇත. පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට අසීරු තත්ත්වයක් පවතී. ඒවා පිළිබඳ ප්‍රාදේශීය, පළාත් දේශපාලඥයින්ට හා රාජ්‍ය බලධාරීන්ට පෙන්වාදීමට ද මෙය යොදා ගත හැකිය.

4. නීතියේ සාධාරණත්වය හා මානව හිමිකම් සඳහා පෙනී සිටීම.

කිසියම් සමාජ කණ්ඩායමක් අසාධාරණයට ලක්වන අවස්ථාවක දී නීතියේ පිහිට පැතීමටත් මානව හිමිකම් ආරක්ෂා කරගැනීමටත් මෙය භාවිතා කළ හැක. උදාහරණයක් වශයෙන් හුණුගල් කර්මාන්තයක් ආශ්‍රිතව ජීවත්වන මිනිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වයට වන හානිය පිළිබඳ වීඩියෝවක් නිර්මාණය කිරීම හරහා මිනිසුන්ගේ යහපැවැත්ම ආරක්ෂා වන අයුරින් එම කර්මාන්තයේ නියැළීම පිළිබඳ සාකච්ඡාවක්

ආරම්භ කළ හැකිය.

5. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය නොපවසන හඬට ඉඩක් ලබා දීම.

ප්‍රජාවේ ඇති ගැටලුවක්, ආදර්ශමත් කතාවක් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රධාන ධාරාවේ මාධ්‍ය තුළින් ලැබෙන අවස්ථාව ඉතා සීමිතය. එසේම එම මාධ්‍ය සාකච්ඡා කරන්නේද ඔවුන්ට විශාල ප්‍රචාරණයක් ලබා ගත හැකි සමාජ ගැටලු පිළිබඳ පමණි. උදාහරණයක් වශයෙන් ප්‍රධාන ධාරාවේ පවතින මාධ්‍ය විසින් මෙරට පවතින අධිවේගී මාර්ගවල පවතින යම්කිසි අඩුපාඩුවක් පිළිබඳ ඉතා ඕනෑකමින් සාකච්ඡා කළ ද දුෂ්කර ගම්මානවල පවතින මාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට දරන්නේ අඩු ප්‍රයත්නයකි. එබැවින් තම ප්‍රජාවේ පවතින ගැටලු ඉදිරිපත් කිරීම සඳහා ඇති හොඳම මාධ්‍ය බවට මෙය පත්වී ඇත.

6. කාන්තාවන් බලගැන්වීම.

කාන්තාවන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය අහිමි වීම, ප්‍රචණ්ඩත්වයට ලක්වීම, දෑවැදි පිරිනැමීම පිළිබඳ ප්‍රශ්න ඇතිවීම, ළමා විවාහයන් සිදුවීම, ස්ත්‍රී - පුරුෂ සමාජභාවය, එච්.අයි.වී/ඒඩ්ස් නිවාරණය ආදිය පිළිබඳ සමාජය දැනුවත් කිරීම සඳහා ප්‍රජා වීඩියෝ මාධ්‍ය උපයෝගී කරගනු ලබයි.

ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය තුළින් එහි ප්‍රතිලාභ හිමිවන්නේ ප්‍රජාවටයි. ඔවුන් විසින් තීරණය කරන ලද මාතෘකාව, තේමාව ඔස්සේ ගොඩනගන ලද කතාවට අනුව ප්‍රජාවට ලැබිය යුතු අවධානය හා ගැටලුවලට විසඳුම් ක්‍රමයෙන් ළඟා වෙයි.

## ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය කිරීමේ ප්‍රයෝජන

- ප්‍රජාවේ මිනිසුන් විසින් තම ප්‍රශ්න පිළිබඳ එකිනෙකා සමඟ කතා කරනු ලබයි. ප්‍රශ්නයට අදාළ කතාව ඔවුන් විසින්ම නිරූපණය කරමින් සාකච්ඡා කරයි.
- සමාජයේ කොන්වුණු පුද්ගලයින් තමන්ගේ දුක් ගැනවිල්ල ප්‍රකාශ කිරීමට හැකි වේ. කාන්තාවන්ට, තරුණයින්ට, HIV ආසාධිතයින්ට තම නියෝජනය මෙම මාධ්‍ය හරහා පෙන්විය හැක.
- දේශපාලඥයින්, රාජ්‍ය නිළධාරීන් සහ අධිකාරියලත් බලධාරීන් වෙතට කිසියම් ප්‍රජාවක ඇති ගැටලු ඉදිරිපත් කළ හැකි වීම.
- තමන්ගේ ප්‍රශ්න ඉක්මනින් හා පැහැදිලිව ඉදිරිපත් කළ හැකිවීම, මෙහිදී වීඩියෝව හරහා තම ප්‍රජාවේ හා අනෙක් පාර්ශවයන්ගේ ඉක්මන් ප්‍රතිචාර ලබා ගත හැකිය.
- ප්‍රජාව විසින් පෙළගස්වන ලද ඕනෑම මාතෘකාවක්, තේමාවක් ඔස්සේ වීඩියෝව නිර්මාණය කරගත හැකිවීම.
- අධ්‍යාපන මට්ටම හෝ සාක්ෂරතාවය අභිබවා ඕනෑම පුද්ගලයෙකුට මෙය නරඹා තේරුම් ගත හැකිවීම.
- ඕනෑම සමාජයකට කතාන්දර ඇසීම, නාට්‍ය බැලීම, වාචික සම්ප්‍රදාය ඉතා වැදගත් සංස්කෘතික අංගයක් වීම.
- වීඩියෝව නිර්මාණය කිරීම ඔස්සේ තාක්ෂණික හා අන්තර්පුද්ගල සන්නිවේදන කුසලතා සංවර්ධනය වීම නිසා ආත්ම විශ්වාසය ගොඩ නැඟීම.
- අනෙකා වෙනුවෙන් පෙනී සිටීම/උද්දේශනය (advocacy) සහ නායකත්ව ලක්ෂණ ශක්තිමත් වීම.
- පුද්ගලයින් තුළ සාමුහිකත්වය හා අරමුණක් වෙනුවෙන් කැපවීමේ ගුණාංග වැඩිදියුණු වීම.
- ප්‍රජාවේ සාමාජිකයින් තුළ කැමැත්ත සහ උද්වේගය ඇතිවීම.

විවිධ ආයතන විසින් ඒවාගේ රැකියාවල නිරත වී සිටින සේවකයින් සම්බන්ධ කටයුතු සඳහා ද මෙම මාධ්‍ය යොදා ගනී. එහි දී කාර්ය මණ්ඩලය සඳහා පුහුණුවීම් හා අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම, ආයතන ව්‍යාපෘති සැලසුම් කිරීම හා ඇගයීමට ලක් කිරීම සඳහා මෙම මාධ්‍ය භාවිතා කරන බව පෙනී යයි.

## ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය කරන්නේ කෙසේද?

වීඩියෝ කතාවක් නිර්මාණය කිරීම සඳහා ප්‍රජාවක පවතින ගැටලුවක් තෝරා ගනීමේ දී එහි ජීවත්වීම මගින් ලබාගත් අත්දැකීම් හෝ නිරීක්ෂණයන් අපට උපයෝගී කරගත හැක. යම්කිසි ප්‍රජාවක පවතින ප්‍රබලතම ගැටලුව හඳුනාගැනීම සඳහා ප්‍රජා ගැටලු සිතියම් ගත කිරීම (mapping community issues) භාවිත කළ හැකිය. මෙය තුළින් ප්‍රජාවක පවතින ගැටලු හඳුනාගැනීමටත් ලැයිස්තුගත කර ගැනීමටත් හැකි වේ. පළමුවෙන්ම අප ප්‍රජාවට අවතීර්ණ වී එහි ජීවත්වන පුද්ගලයින් සමඟ සබඳතාවයන් ගොඩනඟා ගත යුතුය. ඒ සඳහා ඔවුන් සමඟ දිගින් දිගටම සාකච්ඡාවන් සිදු කරමින් සබඳතා ගොඩනඟා ගැනීම ඉතා වැදගත් වේ. ප්‍රජාව තුළට පිවිසීම සඳහා සහභාගීත්ව ගැමි එළඹුම (participatory rural appraisal) අනුගමනය කළ හැක. මෙම එළඹුම මගින් ප්‍රජාවේ සම්පත් භාවිත කරමින් එහි පවතින ගැටලු හඳුගැනීමත් ප්‍රමුඛතාවය අනුව ගැටලු ලැයිස්තු ගත කිරීමත් ගැටලු විසඳීම සඳහා විකල්ප සොයා බැලීමත් සිදු කරනු ලබයි. ප්‍රජාවෙන් පිටස්තර පුද්ගලයින් ප්‍රජාවට අවශ්‍ය කරන තාක්ෂණික දැනුම හා හැකියාවන් ලබා දෙමින් පහසුකාරකයින් ලෙස මෙහි දී කටයුතු කළ හැකිය. සහභාගීත්ව ගැමි එළඹුම මගින් කණ්ඩායම් සහභාගීත්වය හා කණ්ඩායම් සාකච්ඡා දිරිගන්වනු ලබයි. ප්‍රජාවේ පවතින පින්තූර, සංකේත ආදී වූ භෞතික ද්‍රව්‍ය භාවිතා කරමින් ඔවුන්ගේ ගැටලු පිළිබඳ අදහස් දැක්විය හැක. ඒවා පිළිබඳ ගුණ - දොස් ප්‍රකාශ කිරීමට ප්‍රජාවේ අනෙක් පුද්ගලයන්ට හැකියාව ඇත. එබැවින් ප්‍රජාවක ගැටලු හඳුනා ගනිමින් ප්‍රජා සහභාගීත්වය ඇතිව වීඩියෝවක් නිර්මාණය කිරීම සඳහා ප්‍රජාවකට පිවිසීමේ දී සහභාගීත්ව ගැමි එළඹුම ඉතා යෝග්‍ය ප්‍රවේශයක් ලෙස පෙනී යයි. මෙහි දී ප්‍රජාවේ සිටින සියලුම පුද්ගලයින් මේ සඳහා සහභාගී කරවා ගැනීම අනිවාර්ය වේ. ස්ත්‍රී - පුරුෂ භාවය, පන්තිය, කුලය, ආගම, ජාතිය, වයස ආදී වූ සමාජ ස්ථරායනයන් නොසලකා හැර ප්‍රජා සහභාගීත්වය ලබා ගත යුතුය. ප්‍රථමයෙන්ම ඔවුන් සමඟ ප්‍රජාවේ පවතින හොඳ, ධනාත්මක දේවල් සාකච්ඡා කළ යුතුය. ඉන් පසුව ක්‍රමක් ක්‍රමයෙන් ප්‍රජාවේ පවතින ගැටලුවලට අවධානය යොමු කිරීම වැදගත් වේ. ඔවුන් මුහුණපාන ගැටලු හඳුනාගැනීමේ දී ඔවුන්ව හිතවන්නට හා සාකච්ඡා අරම්භ කිරීමට පෙළඹිය යුතුය. නිහඬව, සැගවී සිටින පුද්ගලයින් ද සාකච්ඡාවට සහභාගී කරවාගෙන ඔවුන්ගේ අදහස් ද දැනගත යුතු වේ. ඉන්පසුව ගැටලු ලැයිස්තුවක්

රූප සටහන 01: ප්‍රජා වීඩියෝවක් නිර්මාණය කිරීම සඳහා ප්‍රජා සහභාගීත්වය ලබා ගන්නා ආකාරය

ප්‍රජාවේ ගැටලු හඳුනා ගැනීම

ප්‍රමුඛතාවය අනුව ලැයිස්තු ගත කිරීම

පුද්ගලයින් හඳුනා ගැනීම (සිද්ධි අධ්‍යනය)

කතා පුවත සූදානම් කිරීම

කැමරා රූප හඳුනා ගැනීම

කතාව රූපගත කීරීම

නැවත සකස් කිරීම


කතාව විකාශනය කිරීම

ප්‍රජාවේ ප්‍රතිචාරය හා විවේචන විමර්ශනය කිරීම

සංවාදයක් ගොඩනැගීම

ගැටලුවලට විසඳුම් ලබා ගැනීම

ප්‍රජාවට වගකීම පැවරීම



ප්‍රජා සහභාගීත්වය

සකස් කිරීමටත් ඒවා ප්‍රමුඛතාවය අනුව සකස් කර ගැනීමටත් ප්‍රජාවට අවස්ථාව ලබා දිය යුතු වේ. මෙලෙස ප්‍රජාවක ගැටලු හඳුනාග ැනීමේ දී ප්‍රජා සිතියම (community map) භාවිතා කළ හැක. ප්‍රජාවේ පවතින ගැටලු හඳුනා ගැනීමත් සමඟ ප්‍රජා වීඩියෝව නිර්මාණය සහ ගැටලුවලට විසඳුම් ලබා ගැනීම දක්වාම ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීම අනිවාර්ය වේ.

ඉහත දැක්වූ සෑම පියවරක් සඳහාම ප්‍රජාවේ සහභාගීත්වය ලබාගැනීමෙන් ගැටලුවලට සුදුසුම විසඳුම් ලබාගැනීම සඳහා පහසු මාර්ග යක් විවෘත කරගත හැක.

ප්‍රජා වීඩියෝවක් නිර්මාණය කිරීමේදී අපට කතාවක්, කතන්දරයක් ගොඩනැගීමට සිදුවන අතර එහිදී අනුගමනය කළයුතු මූලිකාංග කිහිපයක් දක්නට ලැබේ. එහිදී සිද්ධි අධ්‍යනය (case study) සඳහා වැදගත් ස්ථානයක් හිමි වේ. ප්‍රජාවේ පවතින ගැටලුව තවදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා සිද්ධි අධ්‍යනයක් සිදු කළ යුතු වේ. පහත දැක්වෙන්නේ ප්‍රජාවන් තුළ දක්නට ලැබෙන මත්ද්‍රව්‍ය පිළිබඳ ගැටලුව සඳහා සිදුකරන ලද සිද්ධි අධ්‍යයනයකි.

| | |
|---|---|
| ගැටලුව | දිගන ප්‍රදේශයේ ජීවත් වන අවුරුදු 21 ට අඩු නව යෞවනයන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම. |
| කුමක් ද? | නවයෞවනයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟම සමාජ ප්‍රශ්න රාශියක් ඇති වෙමින් පවතී. ඇබ්බැහිවූවන් නියෝජනය කරන පවුල් තුළ ප්‍රශ්න වැඩි වීම, පාසල් අධ්‍යාපනය කඩාකප්පල් වීම, විරුකියාව, අපචාර හා අපරාධ වැඩිවීම සඳහා මෙලෙස නවයෞවනයන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම බලපා ඇත. |
| කවු ද? | ප්‍රදේශයේ පාසල් ශිෂ්‍යයින් සහ තරුණයින් ඉලක්ක කරගෙන මත්පෙති, මදන මෝදක, මත්වන බීම වර්ග,කේරල ගංජා, දුම්කොළ ජාවාරම ක්‍රියාත්මක වේ. |
| කොහොම ද? | නවයෞවනයන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම සඳහා මනෝවිද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක හා පාරිසරික සාධක වැඩි වශයෙන් බලපා ඇත. |
| බලපෑම | මත්ද්‍රව්‍ය නිසා ඇබ්බැහිවූවන්ට පමණක් නොව ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට, ඥාතීන්ට, හිතමිතුරන්ට, අසල්වාසීන්ට හා ප්‍රදේශවාසීන්ට සෘජුවම බලපෑම් ඇති වේ. දරුවන්ගේ හා කාන්තාවන්ගේ රැකවරණයට හා ආරක්ෂාවට සිදුවන බලපෑම් නිසා ගැටලු රැසක් ඇති කිරීමට සමත් වී ඇත. මේ නිසා ඔවුන් ජීවත්වන මුළු ප්‍රජාවටම හා අවසාන ප්‍රතිඵල ලෙස මුළු රටටම මෙයින් බලපෑම් ඇති වේ. |
| යෝජනා කරන විසඳුම් | මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ නවයෞවනයන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීම.<br><br>ළමා හා තරුණ කණ්ඩායම් (ක්‍රීඩා සමාජ, ළමා සමාජ, දහම් පාසල්) සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ අධ්‍යාපන වැඩසටහන්, කණ්ඩායම් උපදේශන වැඩමුළු හා පුහුණුවීම් ලබාදීම.<br><br>පාසල් නොයන දරුවන් නැවත පාසල්වලට යොමු කිරීම.<br><br>ප්‍රදේශයේ පවතින ප්‍රජා සමිති, ග්‍රාම සංවර්ධන සමිති දැනුවත් කිරීම හා බලගැන්වීම. මත්ද්‍රව්‍ය වෙළඳාම හා බෙදා හැරීම වැළැක්වීම සඳහා පොලීසියේ, සුරාබදු දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබා ගැනීම. |


මේ ආකාරයෙන් ප්‍රජාව තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුව පිළිබඳ මනා විවරණයක් ලබා ගැනීමෙන් පසුව වීඩියෝව නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය කරන සම්පත් සංවිධානය කරගත යුතුය. නිර්මාණය කිරීමට බලාපොරොත්තුවන කතාව සඳහා පිටපත (script) සකසා ගැනීමට හැකිවේ නම් කතාව පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ගොඩනගා ගත හැකිය. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ පුද්ගලයෙකු තම ජීවිතය මතින් නිදහස් කරගත් ආකාරය දක්වන කතා පුවතට ලියන ලද පිටපතක් මෙසේ පහතින් දක්වමු.

ව්‍යාපෘතියේ නම : මතින් නිදහස් තාරුණ්‍යයක්
නිෂ්පාදකයාගේ නම : නිරාජ් පීරිස්
දිනය : 2016 පෙබරවාරි 08

| දෘෂ්‍ය (Video) | ශ්‍රව්‍ය (Audio) |
|---|---|
| මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ නව යෞවනයනගේ ගම සහ නිවාසය දුරස්ථ රූපයකින් (long shot) ලබා ගැනීම. නිවස ඉදිරිපිට ඔහු සිටගෙන සිටි ආකාරය දුරස්ථ රූපයකින් ලබා ගැනීම. | සමකාලීන ශ්‍රී ලංකා සමාජය තුළ දක්නට ලැබෙන සමාජ ප්‍රශ්නයක් ලෙස පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම දැක්විය හැක. තරුණ ජීවිත දහස් ගණනක් බිලි ගැනීමට හැකි වූ වසංගතයක් ලෙස මත්ද්‍රව්‍ය හැඳින්වීමට හැක. ඊට අමතරව සමාජය තුළ ප්‍රශ්න රාශියක් ඇති කිරීමට මත්ද්‍රව්‍ය වග කියනු ලබයි. එවැනි විනාශයක් ලබා දෙන්නා වු මත්ද්‍රව්‍යවලින් අපට නිදහස් විය හැකිය. ඔව්, ඔබට හැකියි. එලෙස මතින් නිදහස් ජීවිතයක් ගොඩනගා ගත් තරුණයකුගේ කතාවයි මේ. |
| මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ නව යෞවනයා සමඟ සිදුකරන සම්මුඛ සාකච්ඡාව සඳහා මධ්‍ය දුරස්ථ රූප (mid long shot) භාවිතා කරනු ලබයි. | පෞද්ගලික හා පවුලේ තොරතුරු, අධ්‍යාපන තත්ත්වය, මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹීම හා ඇබ්බැහි වීම, එයින් තමන්ගේ ජීවිතය වෙනස් වූ ආකාරය හා මුහුණපාන්නට වු ගැටලු පිළිබඳ ප්‍රශ්න විධිමත් සම්මුඛ සාකච්ඡාවකින් (formal interview) අසනු ලබයි. |
| අන්තරායක ඖෂධ පාලන ජාතික මණ්ඩලයේ උපදේශකවරයෙකු සමඟ සිදුකරන සම්මුඛ සාකච්ඡාව මධ්‍යස්ථ රූපයකින් (mid shot) ලබා ගැනීම. | නව යෞවනයනයා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම සඳහා බලපාන ලද සාධක පිළිබඳ අවිධිමත් සම්මුඛ සාකච්ඡාවක් (informal interview)පැවත් වීම. |
| මත්ද්‍රව්‍යවලින් නිදහස් වූ පුද්ගයා සමඟ පවත්වන සම්මුඛ සාකච්ඡාව මධ්‍යස්ථ රූපයකින් (mid shot) ලබා ගැනීම. | මත්ද්‍රව්‍යවලින් නිදහස් වීම සඳහා තම දැනුම, ආකල්ප වෙනස් කර ගත් ආකාරය හා පුනරුත්ථාපනය වීම පිළිබඳ අවධිමත් සම්මුඛ සාකච්ඡාවක් පැවත් වීම. |
| වර්තමානය වන විට ඔහු මෝටර් රථ කාර්මිකයෙකු ලෙස තමන්ගේ ව්‍යාපාරය සිදු කරගෙන යන ආකාරය පිළිබඳ දර්ශන හා සම්මුඛ සාකච්ඡාව දුරස්ථ රූප හා මධ්‍යස්ථ රූප මගින් ලබා ගැනීම. | පුනරුත්ථාපනය තුළ දී වෘත්තීය උපදේශනය හා පුහුණුවීම් ලබා ගැනීම හා උපදේශනය ඔස්සේ අලුත් ජීවිතයකට පිවිසි ආකාරය පිළිබඳ අවධිමත් සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීම හා වීඩියෝව අවසන් කිරීම. |

ප්‍රජාවේ සිටින සෑම පුද්ගලයෙකුටම අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති වීමට පුළුවන. එබැවින් ඒ සඳහා යොදාගත හැකි විකල්පයක් ලෙස කටු චිත්‍ර සටහන (storyboarding) හැඳින්විය හැක. අපට මෙය භාවිත කරමින් සරල කටු සටහනකින් කතාව චිත්‍රයට නැගිය හැක. මෙය චිත්‍රයට නැගීම සඳහා ප්‍රජා සහභාගීත්වය ලබා ගත යුතු අතර ඔවුන්ට ඒ සඳහා සහයෝගය ලබා දිය යුතුය. වීඩියෝව සඳහා යොදාගන්නා කැමරා රූප (shots) හා දර්ශන (scenes) කතාවේ අන්තර්ගතය අනුව තීරණය කළ යුතුය. අති සමීප රූප (extream close up), සමීප රූප (close up), දුරස්ථ රූප (long shot), අති දුරස්ථ රූප (extream long shot), ඉහළ කෝණ රූප (top angle shot), පහළ කෝණ රූප (low angle shot) ආදී වූ කැමරා රූප වීඩියෝව නිර්මාණය කිරීම සඳහා ගැළපෙන ආකාරයෙන් යෙදා ගත යුතුය. ඇත්ත වශයෙන්ම මේ සඳහා ප්‍රජාවේ සිටින පුද්ගලයින්ට පුහුණුවක් ලබා දිය යුතුය. පහත දැක්වෙන්නෙ එලෙස කැමරා රූප යොදන ලද කටු චිත්‍ර සටහනකි.

**රූප සටහන 02**: කැමරා රූප යොදන ලද කටු චිත්‍ර සටහනකි




වීඩියෝව තුළින් පෙන්වීමට හා ප්‍රජාව දැනුවත් කිරීමට බලාපොරොත්තු වන තේමාව වර්ධනය කිරීම සඳහා සම්මුඛ සාකච්ඡාවන් (interviews) යොදා ගත යුතුය. එහිදී විධිමත් සම්මුඛ සාකච්ඡාවන් (formal interviews) හෝ අවිධිමත් සම්මුඛ සාකච්ඡාවන් (informal interviews) භාවිත කිරීම සඳහා නිදහස පවතී. නාට්‍යමය ස්වරූපයෙන් වීඩියෝව නිර්මාණය කරන අවස්ථාවක දී ඒ සඳහා අවශ්‍ය කරන දෙබස් සකසා ගත යුතු අතර පෙර පුහුණුවීම්වල නිරතවීමටත් නැවත නැවත කැමරා රූප ලබා ගැනීමටත් සිදුවේ. මෙලෙස ලබා ගන්නා ශ්‍රව්‍ය හා දෘෂ්‍ය පථ (audio & video clips) පරිගණකය හා මෘදුකාංග (software) භාවිතා කිරීම මඟින් වීඩියෝ මාලාවක් (video sequence) සකසා ගනී. ඒ සඳහා 'lightworks', 'premier pro' යන

මෘදුකාංග හෝ වෙනත් මෘදුකාංගයක් හෝ යොදාගත හැකිය. මෙම මෘදුකාංග භාවිත කරමින් වීඩියෝව නැවත සකස් කිරීමටත්, එහි ආරම්භය හා අවසානය සකස් කර ගැනීමටත් පින්තූර, අක්ෂර, වාක්‍ය, සංකේත යෙදීමටත් වීඩියෝව නිර්මාණය කිරීම සඳහා සහභාගී වූ පුද්ගලයන්ගේ නාමයන් සඳහන් කිරීමටත් හැකි වේ. ඊට අමතරව හඬ පාලනය කිරීමටත්, විවිධ සංගීත නාදයන් හා පසුවාදන එකතු කර ගැනීමටත් මේවා භාවිතයෙන් කළ හැකි වේ.

## ප්‍රජා වීඩියෝ කතා, සමාජ වෙනස හා සමාජ සංවර්ධනය

ප්‍රජා වීඩියෝ කතා මගින් දේශීය දැනුම, විශ්වාස හා ආකල්ප අගයනු ලබන අතර ඒ සඳහා ඉඩක් ලබා දෙනු ලබයි. මේ හරහා ප්‍රජාව සහ සන්නිවේදනය අතර පවතින පරතරය අඩු කරයි. සාමාන්‍ය ජනතාවට ද සමාජය තුළ මාධ්‍යකරුවෙක්, වාර්තාකරුවෙක්, කතාකරුවෙක් බවට පත්වීමට අවස්ථාව මෙයින් උදා වෙයි. ප්‍රජාවක්, ගමක් මාධ්‍ය ආයතනයක් බවට පත් කරයි. මෙය සාමාන්‍ය ජනතාවගේ මාධ්‍ය ලෙස හැඳින්වීම යුක්ති සහගතය. සමාජයේ ජීවත් වන ඕනෑම පුද්ගලයෙකුට ප්‍රජා වීඩියෝ කතාකරුවෙකු බවට පත් විය හැක. මෙය තුළ පෞද්ගලික න්‍යාය පත්‍රයක් වෙනුවට ප්‍රජාවේ ඕනෑ එපාකම් මත ගොඩනැගුණු පොදු න්‍යාය පත්‍රයක් දක්නට ලැබේ. කැමරාවක් හැසිරවීම, දර්ශන ලබා ගැනීම, කතාව නිර්මාණය කිරීම, සංස්කරණය කිරීම, අවසන් කිරීම සහ මෘදුකාංග භාවිත කිරීම තුළින් පුද්ගලයෙකුට තම තාක්ෂණික දැනුම වර්ධනය කරගැනීම ආදිය ඉටු කර ගැනීමට මෙම නිර්මාණය හරහා හැකි වේ.

''මම දැනගෙන හිටියේ නැහැ කැමරාවක් හසුරුවන්න. වීඩියෝ කතාවක් නිර්මාණය කරන්න. වීඩියෝව නැවත සංස්කරණය කරන්න. නමුත් දැන් මේ සෑම දෙයක්ම මගේ ජීවිතයට ලබා ගන්න මට හැකි වුණා.''

විශ්මි මදුෂිකා
ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය පිළිබඳ
වැඩමුළුව සඳහා සහභාගී වූවෙක්


''මගේ ජීවිතයේ පළමුවතාවට මට කැමරාවක් ස්පර්ශ කරන්න අවස්ථාවක් ලැබුණා. මම දැන් දන්නවා කොහොමද කැමරාවක් හසුරුවා විවිධ කැමරා රූප සහ කෝණ ගන්නේ කියලා.''

ජයචිත්‍රා සෙලම්බරම්
ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය පිළිබඳ
වැඩමුළුව සඳහා සහභාගී වූවෙක්

ප්‍රජා වීඩියෝ කතා තුළ කැමරාව හසුරුවන්නේ ද, වාර්තාකරන්නේ ද, සම්මුඛ සාකච්ඡා පවත්වන්නේ ද, රඟපෑම් කරන්නේ ද ප්‍රජාවේ සිටින සාමාජිකයන් විසිනි. එමනිසා ප්‍රජාව තුළ යම් කිසි කතිකාවතක් ඇති කිරීමට මෙය ආරම්භයක් සපයයි. කිසියම් ප්‍රදේශයක ජීවත් වන ජනතාවට මුහුණ දීමට සිදු වී තිබෙන ප්‍රශ්නයක් මැඩලීම සඳහා ඔවුන් පෙළඹවීමටත් ඉහළ නිළධාරීන්ව දැනුවත් කිරීමටත් මෙය භාවිතා කළ හැකිය. ප්‍රජාව තුළ තිරස් සංවාදයක් (horizontal dialog) ඇති කිරීමටත් පසුව ප්‍රතිපත්ති සම්පාදකයින්, පරිපාලන නිළධාරීන් සහ දේශපාලඥයින් සමඟ සිරස් සංවාදයක් (vertical dialog) ඇති කර ගැනීමටත් මෙයින් හැකි වේ.

ප්‍රජා වීඩියෝ අගතියටපත් වූ සමාජ කණ්ඩායම් සඳහා පෙනී සිටීම/සමාජ උද්දේශනය (community video for social advocacy) සඳහා යොදා ගනී. මානව හිමිකම්, අවතැන් වූවන්, සුළු ජාතීන්ගේ අයිතිවාසිකම්, ළමා හා කාන්තා හිංසනය, එච්.අයි.වී/ඒඩ්ස් ශරීර ගත වූ පුද්ගලයින්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා පෙනී සිටීමටත් සමාජය දැනුවත් කිරීමටත් මේවා ඔස්සේ කළ හැක. පරිසරය සංරක්ෂණය කිරීම, කාබනික පොහොර භාවිතය, සත්ව හිංසනය පිටු දැකීම ආදී තේමාවන් ඔස්සේ ද ප්‍රජා වීඩියෝ නිර්මාණය වී ඇත. මීට අමතර යම්කිසි සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ දී එය අධීක්ෂණය හා අගැයීම (monitoring & evaluation) සඳහා ද මෙම මාධ්‍ය ප්‍රයෝජනවත් වේ. යම්කිසි සංවර්ධන ව්‍යාපෘතියක් අතර මඟ නවතා තිබීම හෝ නිළධාරීන්ගේ තනි තීරණය මත ක්‍රියාත්මක කිරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ යන අවස්ථාවල දී ප්‍රජාවට

රූප සටහන 03: ප්‍රජා වීඩියෝ කතා මඟින් සිරස් සහ තිරස් සංවාදයක් ඇති වන ආකාරය.




මැදිහත්වීම සඳහා මෙය පිටුවහලක් වේ.

ප්‍රජා වීඩියෝ මගින් ප්‍රජාව බලසතුකරණය (community empowerment) කරනු ලබයි. ප්‍රජාවේ පවතින ගැටලු මෙනවාද? ඒවා ඉදිරිපත් කරන්නේ කෙසේද? කතා පුවත කුමක්ද? කතාව පෙළගස්වන්නේ කෙසේද? යන්න ප්‍රජාව විසින්ම තීරණය කරනු ලබයි. ප්‍රජා වීඩියෝ යනු සිනමාවෙන් හා රූපවාහිනියෙන් වෙන් වු මාධ්‍යකි.මේවා දේශීය ජනතාවගේ, ගැමියන්ගේ දුකට පත්වුවන්ගේ, අසාධාරණයට ලක්වුවන්ගේ සාමුහික උත්සාහය තුළින් නිර්මාණය වේ. කතාව සැලසුම් කිරීම, ප්‍රශ්න ඇසීම, සාකච්ඡාවන් ගොඩනැගීම, පොදු එකගතාවයන් ඇති කිරීම, ප්‍රශ්න සඳහා විසදුම් ලබා ගැනීම තුළදී ප්‍රජාව සාමුහිකව කටයුතු කරමින් බලයක් ගොඩනගා ගනී. ප්‍රධානධාරාවේ මාධ්‍ය තුළදී අදහස් ප්‍රකාශ කිරීම ඉහළ සිට පහළට සිදුවන සිරස් සන්නිවේදනයක් තිබුණ ද ප්‍රජා වීඩියෝ මාධ්‍ය තුළදී ප්‍රජාවේ සියලු දෙනාගේම අදහස් සලකා බලමින් තිරස් සන්නිවේදනයක් සිදු කරනු ලබයි. මෙහිදී ඉතා වැදගත් කරුණක් වන්නේ අන්තර් පුද්ගල සන්නිවේදනය (interpersonal communication) තුළින් සාකච්ඡාවන් ගොඩ නැගීමයි.

ප්‍රජා වීඩියෝ නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය තුළ දී පුද්ගලයින් මෙය නැරඹීමට පමණක් නොව ඒ පිළිබඳ කතා කිරීමට, සිතීමට, විවේචනයන් ඉදිරිපත් කිරීමට, විසඳුම් යෝජනා කිරීමට පොළඹවයි. මේ නිසා මෙය දිගින් දිගටම සංවාදයට හා විචාරයට ලක්වන ක්‍රියාකාරමක්, වැඩසටහනක් ලෙස හැඳින්විය හැක. වීඩියෝ කතාව තුළ ඇති අන්තර්ගතය පිළිබඳ තේරුම් ගනිමින් සමාජයේ ජීවත් වන අයෙකු වශයෙන් මේ සඳහා මට කළ හැකි දේ කුමක්ද? සමාජයේ පවතින පරමාදර්ශි තත්ත්වයන් ඉදිරියට ගෙන යාම සඳහා මාගේ සහයෝගය ලබා දෙන්නේ කෙසේද? පිළිබඳ ප්‍රජාව සිතන්නට පටන් ගනී. මේ අයුරින් අභිප්‍රේරණය වූ ප්‍රජාව තුළ සමාජ වෙනස සහ සමාජ සංවර්ධනය සඳහා පෙළ ගැස්වීමක් හා උද්යෝගයක් ඇති වේ. පහතින් සාකච්ඡා කරන්නේ සමාජ වෙනස සහ සමාජ සංවර්ධනය සඳහා ප්‍රජා වීඩියෝ කතා බලපාන

ආකාරයන් කිහිපයක් පිළිබඳවයි.

1 සංවාදය මඟින් සවිඥානය ඇති කිරීම.

ප්‍රජා වීඩියෝ කතා හරහා සමාජයේ පවතින ප්‍රශ්න සාකච්ඡා කිරීම තුළින් එහි ජීවත් වන පුද්ගලයින් තමන්ගේ අවධානය ඒ සඳහා යොමු කරයි. එයින් ප්‍රජාව තමන් මුහුණදෙන ගැටලු පිළිබඳ දැනුවත් වේ. පවුල තුළ කිසිදා කතා නොකරන හා කලාතුරකින් කතා කරන කාන්තාවන්ට හිරිහැර කිරීම, ළමා අපචාර, නිදහස සීමාවීම, නොසලකා හැරීම, මද්‍යසාර භාවිතය හා ගැටුම් ඇති වීම ආදී ප්‍රශ්න පිළිබඳ පවතින තොරතුරු ප්‍රජාවට ලබා දීමට මෙම මාධ්‍ය හරහා හැකි වේ. නිහඬව සැඟවී සිටින පුද්ගලයින්ගේ සිහිය අවදි කිරීමටත් ඔවුන්ගේ හඬට ඉඩක් ලබා දීමටත් මෙයින් හැකියාව ලැබේ.

2. සබඳතාවයන් ගොඩනැංවීම.

මෙම මාධ්‍ය ඔස්සේ පුද්ගලයින්, කණ්ඩායම්, ප්‍රජාවන් හා සමාජ අතර සබඳතා ගොඩනැංවිය හැක. ගැටුම් විපරිවර්තනය කිරීමේ දී ගෝත්‍ර, ජනවර්ග, රටවල් හා කලාප අතර සංහිඳියාව ඇති කිරීම සඳහා ප්‍රජා වීඩියෝ බහුලව ප්‍රයෝජනයට ගනී. ඊට අමතරව ග්‍රාමීය ජනතාව හා ප්‍රාදේශීය පාලකයින් අතර සංවර්ධන කටයුතු සඳහා සබඳතාවයක් ඇති කිරීමට ද මෙය උපකාරී වේ.

3. සාමුහිකත්වය තහවුරු කිරීම.

ප්‍රජා වීඩියෝ හරහා තනි පුද්ගලයෙකුගේ ප්‍රශ්නයක්, අත්දැකීමක් සමාජගත කරන අවස්ථා ද ඇත. ඉන්පසු මුළු ප්‍රජාවම ඒ වටා රැස්වෙයි. උදාහරණයක් වශයෙන් යම් ප්‍රදේශයක පවතින කුණු කසල සහ ඒ ආශ්‍රිතව මතුවන සෞඛ්‍ය හා සමාජීය ප්‍රශ්න හමුවේ මිනිසුන් එක්ව හඬක් නැංවීමට පෙළඹීම දැක්විය හැක.

4 ධනාත්මක ආදර්ශයන් පෙන්වාදීම.


ප්‍රජා වීඩියෝ ඔස්සේ දියුණුව, සාර්ථකත්වය, ජයග්‍රහණය මුදුන් පමුණුවා ගත් පුද්ගලයන්ගේ ආදර්ශ කතා ,ආදර්ශමත් චරිත කතා (success stories) ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. "මත්ද්‍රව්‍යවලින් නිදහස් වූ තරුණයෙක්," "කෘෂිකර්මයෙන් ජය ගත් ගොවියෙක්", "රෙදිපිළි මැසීමෙන් ජයගත් කාන්තාවක්" ආදී ලෙස ජීවිතය ජයගත් පුද්ගලයින් පිළිබඳ සමාජය දැනුවත් කිරීමටත් ආදර්ශමත් චරිත හඳුන්වාදීමටත් මෙය යොදා ගත හැක. කාන්තාවන්ට ද පවුලේ ආර්ථිකය සඳහා දායක වීමට හැකිය යන්න පෙන්වාදීමට ඔවුන්ව අභිප්‍රේරණය කරමින් නිර්මාණය කර තිබෙන ප්‍රජා වීඩියෝ බොහෝ ප්‍රමාණයක් දැක්නට ලැබේ.

මෙම මාධ්‍ය තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ ප්‍රජා සහභාගීත්වය තුළින් ප්‍රජාවේ ප්‍රශ්න හඳුනාගැනීම, වීඩියෝව නිර්මාණය කිරීම හා විසඳුම් ලබා ගැනීමයි. මෙයින් පුද්ගලයින් තම ප්‍රශ්න පිළිබඳ සොයා බැලීමට හා කතා කිරීමට පටන් ගනී. කතාව ගොඩනැංවීමේ දී පමණක් නොව කටු චිත්‍ර සටහන ඇඳීම, හඬ පටිගත කිරීම, චරිත නිරූපණය කිරීම සඳහාත් ප්‍රජාව සම්බන්ධ වේ. ප්‍රජාව විසින් නිර්මිත කතාව තුළින් එම ප්‍රජාව නියෝජනය කරන පුද්ගලයින්ගේ හැඟීම්, ආකල්ප, හැසිරීම් රටා වෙනස් කරයි. එක් පුද්ගල කණ්ඩායමක් තවත් පුද්ගල කණ්ඩායමක් දෙස බලන ආකාරය වෙනස් කිරීමට මෙමඟින් පුළුවන. ප්‍රජා වීඩියෝ ගැටුම් නිරාකරණය කිරීම (conflict resolution) සහ සාමදාන කිරීම සඳහා භාවිත කරන උපකරණයක් ලෙස හැඳින්විය හැක. විරසක වූ ගෝත්‍ර, ජන වර්ග අතර අන්තර් සබඳතා ගොඩ නැංවීම සඳහා මේවා උපකාරී වේ. මෙම මාධ්‍ය හරහා ප්‍රශ්න කතා කිරීමට පමණක් නොව විසඳුම් සොයා ගැනීමට ද හොඳ වේදිකාවක් විවෘත වේ. එබැවින් සමාජ ප්‍රශ්න විසදීම සඳහා යොදා ගන්නා අවිහිංසාවාදී ක්‍රමයක් ලෙස ප්‍රජා වීඩියෝ කතා හැඳින්විය හැක. ප්‍රජාවක් තුළ තිබෙන ප්‍රශ්න විසදීමේ දී පුද්ගලයින් තුළ වෙනසක් ඇති කළ යුතු වේ. එනම් පුද්ගලයෙකුගේ ආකල්ප, හැඟීම්, හැසිරීම් හා අභිප්‍රේරණවල වෙනසක් සිදු කළ යුතුය. එමඟින් අනෙක් පුද්ගලයින්, කණ්ඩායම්, ප්‍රජාවන්, සමාජයන් කෙරෙහි ඔවුන්ගේ ඇති අදහස් හා ආකල්ප වෙනස් කරගත හැකිය. තවත් පුද්ගල කණ්ඩායමක්, ප්‍රජාවක් පිළිබඳ තමන්ට ඇති වැරදි ආකල්ප

වෙනස් කර ගැනීමට මේ නිසා හැකි වේ. පැවති සබඳතාවයන් වෙනස් කර ගැනීමටත් දැඩිකර ගැනීමටත් ක්‍රමයෙන් හැකි වේ. පුද්ගලයින්, කණ්ඩායම් හා ප්‍රජාවන් අතර අන්තර් සබඳතා වැඩිදියුණු කර ගැනීමට ප්‍රජා වීඩියෝ උදව් වෙයි. පුද්ගලයින් හා ප්‍රජාවන් වෙනස්වීමත්, අන්තර් සබඳතා වර්ධනයවීමත් තුළින් සමාජ වෙනසකට මාර්ගය විවෘත වේ.

ප්‍රජා වීඩියෝ මගින් ප්‍රජාවක් තුළ සංවාදයක් ඇති කරනු ලබයි. එමගින් ප්‍රජාව තුළ සාමුහික ක්‍රියාකාරකම් (collective actions) වර්ධනය වේ. සාමුහිකව ප්‍රශ්න විසඳා ගැනීමට උත්සහ කිරීමත් ප්‍රශ්න හා ගැටුම්වල පවතින යථාර්ථයන් තේරුම් ගැනීමත් අනාගතය පිළිබඳ සුභවාදී දැක්මක් ඇතිකර ගැනීමත් අන්‍යයන්ගේ දුක්ගැනවිලිවලට කන්දීමත් මගින් ගැටලු විසඳා ගැනීමටත් ගැටුම් විපරිවර්ථනය කරගැනීමටත් හැකි වේ. එමගින් පුද්ගල වෙනස්කම් හා අන්තර් සබඳතාවල වෙනස්කම් සිදු කරගත හැක. පුද්ගලයෙකුගේ ආකල්ප හා හැසිරීම් රටාවල වෙනස් වීමත් ප්‍රශ්න විසඳා ගැනීම සඳහා පෙළඹවීමත් මගින් පුද්ගලයා විපර්යාසයකට ලක් වේ. ප්‍රශ්න හා ගැටුම් දෙස නව ආකාරයෙන් බැලීමටත් විකල්ප හා විසඳුම් සෙවීමටත් පුද්ගලයා තුළ ස්වයං විමර්ශනයක් (self investigation) ඇති වේ. එසේම ප්‍රජාව තුළ සාමුහිකව කටයුතු කිරීමට පෙළඹීමත් අනෙක් පාර්ශවය සමඟ සහයෝගීව කටයුතු කළ හැකි මට්ටමේ සබඳතාමය වෙනස්කම් ඇතිවීමත් මගින් පුද්ගල පෞරුෂය තුළ හා අන්තර් සබඳතාවල වෙනසක් ඇති වීමත් සමඟ සමාජ වෙනස හා සංවර්ධනය සඳහා දොරටු විවෘත කරගනු ලබයි.

රූප සටහන 04: ප්‍රජා වීඩියෝ සමාජ වෙනස්වීම සඳහා බලපාන ආකාරය




මූලාශ්‍රය: Valentina Bau, Community Development Journal Advance Access, 2014.

ප්‍රජා වීඩියෝ මගින් විවෘත සංවාදයක් ඇති කිරීම සඳහා පීඨිකාවක් ගොඩ නගනු ලබයි. සමාජය තුළ අඩුවෙන් කතාබහට ලක්වන කාන්තාවන්ට ඔවුන්ගේ ප්‍රශ්න කතා කිරීමට මෙමගින් අවස්ථාව ලැබෙන නිසා කාන්තාවන් බලගැන්වීම (women empowerment) ලක් වේ. ස්ත්‍රී, පුරුෂ සමාජභාවය, ගෘහස්ථ හිංසනය, ස්ත්‍රී දූෂණ හා අපචාර පිළිබඳ සමාජය දැනුවත් කිරීමට හා ඒවාට විරුද්ධව හඬ නැංවීමට ඇතැම් සමාජවල කාන්තාවන්ට මෙයින් හැකි වී ඇත. මිනිසාගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, පාරිසරික හා සත්ත්ව සංරක්ෂණය සඳහා තර්ජනයක් වන ගැටලු පිළිබඳ සිදුකර තිබෙන ප්‍රජා වීඩියෝ මගින් දසදහස් ගණනක ජනතාව දැනුවත් කිරීමට හා බලගැන්වීමට හැකි වී ඇත.

ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය කිරීමේ දී වැදගත් කරුණක් වන්නේ විනිවිදභාවයකින් යුතුව සන්නිවේදනය කිරීමයි. සත්‍ය පදනම් කරගෙන සම්මුඛ සාකච්ඡාවන් පැවැත්වීම සහ විස්තර හා වාර්තා ඉදිරිපත් කිරීම මගින් තම පණිවිඩය ප්‍රජාව වෙත පැහැදිලිව හා ඍජුව ගෙන යාමට හැකිය. තම ගැටලුව අනෙක් පාර්ශවයට ඉදිරිපත් කිරීමේ දී ගෞරවාන්විතව සිදු කළ යුතුය. සමාජයෙන් අගතියට පත් වූ පුද්ගලයින්, ගණිකාවන්, වීදි දරුවන්, ආබාධිතයින් පිළිබඳ ඔවුන්ගේ චරිතවලට හානි නොවන ලෙසට නිර්මාණයන් සිදු කළ යුතුය. මෙහි දී වැදගත් වන්නේ තම ප්‍රජා වීඩියෝව හරහා පවතින ප්‍රශ්න උග්‍ර කිරීම සඳහා ක්‍රියා නොකිරීමයි. එමෙන්ම කතා පුවත සඳහා සහභාගීවන්නන්ගේ හා කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් මෙම මාධ්‍ය යොදා ගත යුතුය. දේශපාලඥයින්, ප්‍රාදේශීය පාලකයින්, රාජ්‍ය නිළධාරීන්, ව්‍යාපාරිකයින් ආදී පාර්ශව සමඟ කටයුතු කිරීමේ දී සත්‍ය හා නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුය. රටක දේශපාලන පසුබිම, ජාතික ආරක්ෂාව හා වැඩ පරිසරය තුළ ඉක්මන් වෙනස්කම් ඇති විය හැකි බැවින් ඒ පිළිබඳ අවධානයෙන් කටයුතු කළ යුතු වේ. ඊට අමතරව ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය කිරීමේ දී ක්ෂේත්‍ර නිළධාරීන්ට, පුහුණුකරුවන්ට, සහභාගිවන්නන්ට ප්‍රජාවේ සාමාජිකයන්ට සහ වැඩසටහන් ඉදිරිපත් කරන්නන්ට විවිධ දුෂ්කරතාවලට මුහුණදීමට සිදු වේ. එබැවින් ප්‍රජා වීඩියෝ මාධ්‍යකරුවා ඉවසීමෙන් හා කැපවීමෙන් ක්‍රියා කළ යුතු පෞරුෂ ලක්ෂණයන්ගෙන් යුක්ත වීම වැදගත් වේ. මෙම මාධ්‍ය භාවිතයෙන් කිසිම සංස්කෘතියකට, භාෂාවකට, ජන වාර්ගික කණ්ඩායමකට, ලිංග භේදයකට වෙනස්ව සැලකීම නොකළ යුතුය. මෙම වෙනස්කම්වලට සංවේදී වෙමින් තම නිර්මාණය සිදු කිරීම ඉතා වැදගත් වේ. අවතැන් වූ පුද්ගලයින් තේමාව කොට ගෙන ප්‍රජා වීඩියෝවක් නිර්මාණය කිරීමේදී ඔවුන්ගේ වේදනාව, අහිමිවීම් හා අස්ථිරභාවය පිළිබඳ වාර්තාකරුවා සංවේදීව කටයුතු කළ යුතුය.

ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය කිරීම මගින් බලාපොරොත්තු වන්නේ ප්‍රජාවක පවතින ගැටලු විසදා ගැනීම සඳහා ප්‍රජාව බලගැන්වීමයි. එහි දී ප්‍රජාවේ පවතින ගැටලු ප්‍රධාන ධාරාවේ මාධ්‍යක් තුළ ප්‍රචාරය වන තුරු සහ එම ගැටලු විසඳීම සඳහා රජය ක්‍රියාත්මක වනතුරු බලා නොසිට ප්‍රජා සහභාගීත්වය ඔස්සේ ප්‍රශ්නවලට විසඳුම් සෙවීම සඳහා ජනතාව පොළඹවනු ලබයි. මේ නිසා ප්‍රජාව විසින් නිර්මාණය කරන ලද කතාව ප්‍රධාන ධාරාවේ මාධ්‍යයක් තුළ ප්‍රචාරණය නොවීම ගැටලුවක් නෙවේ. ප්‍රජා වීඩියෝ කතා නිර්මාණය කිරීමේ අවසාන ප්‍රතිඵලය විය යුත්තේ එය ප්‍රධාන ධාරාවේ මාධ්‍යයක ප්‍රචාරය කිරීම නොව ප්‍රජාව මුහුණපාන ගැටලුවලට විසඳුම් ලබා ගැනීමයි. එබැවින් ප්‍රජා වීඩියෝ කතාකරුවා ද යම්කිසි මාධ්‍ය ආයතනයක් නියෝජනය කරන මාධ්‍යකරුවෙකු විය යුතු නැත. එසේම ප්‍රජා වීඩියෝ කතාකරුවාගේ මූලික අරමුණ විය යුත්තේ අනාගතයේ දී මාධ්‍යකරුවෙකු වීම නොව සමාජ වෙනස සහ සංවර්ධනය සඳහා උරදෙන සමාජිකයෙකු බවට පත්වීමයි.

**ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි:**

පුෂ්පකුමාර, රවීන්ද්‍ර. (2016). *ප්‍රජා වීඩියෝ කතා*, *කලාලය*, ඉරුදින. කොළඹ. 20-21.

Blanco,C. M.( 2008) Video as a Tool for Change: Gender Discourse in Zapatista Indigenous Communities, Empowering Women for Gender Equity, *Agenda*, Taylor & Francis, Ltd, Abingdon.

David, M J R and Felix, Librero. (1991). *Radio's role in Rural Development, A case of analysis of Mahaweli Community Radio*, Sri Lanka, Thesis submitted to the University of Philippines at Los Banos, Laguna, Philippine.

David, M J R. (2001). Mahawelli Community Radio, A Passion for Radio, *Radio waves and community*, 106 - 113.

De Lange, Naydene. (2008). Women and community-based video: Communicating in the age of AIDS. *Agenda*,19 - 31

Flower,E. & McConville,B. (2009). Diary of a Participatory Advocacy Film Project: Transforming Communication Initiatives into Living Campaigns, Development in Practice, *SAGE Journal*, 19(7), 933-937

Goodsmith, Lauren and Acosta, Angela (2011). *Community Video for Social Change: A Toolkit.* Minneapolis, MN: American Refugee Committee International.USA

Jurriens, E. (2013). Social Participation in Indonesian Media and Art: Echoes from the Past, Visions for the Future, Bijdragen tot de Taal-, Land- en Volkenkunde, J*ournal of the Humanities and Social Sciences of Southeast Asia*, 169(1), 7-36.

Kindon, Sara (2003). Participatory Video in Geographic Research: A Feminist Practice of Looking?, *Area Journal*, 35 (2), 142-153

Moodley,S (2008 ). Telling the Stories of South African Hindu Women: Participatory Video as a Tool for Feminist Research, Agenda: Empowering Women for Gender Equity. *Community Media*, 77, 116-125

Shaw, J. & Robertson, C. (1997) *Participatory Video, A Practical guide to using video creatively in group development work*, London:Routledge.

Show, Jacqneline. (2012). *Using Participatory video for Action Research negotiating the space between social process & Research product*, Milton Keynes, Open University, UK.

UNESCO (1983). *Mahaweli community Radio, Project Findings & Recommendations*. Report prepared for the Government of Sri Lanka by the United Nations Educational, Scientific and Cultural Organization (Unesco), Paris, France United Nations Educational, Scientific and Cultural Organization.

USAID, American Refugee Committee, Communication for Change (2009). *Video for social change: A toolkit. Communication for change Community*, USAID, The United States Government.

Valentina, Bau. (2014). Building peace through social change communication; Participatory video in conflict affected communities, *Community Development Journal*. 1 - 17